## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2014

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1ට අනුව සියලු වත්කම් වගකීම් ආදායම් හා වියදම් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කළයුතු වුවත්, භාවිතයට ගන්නා නමුත් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති රු.1,223,917,203ක පිරිවැය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේදී රු. මිලියන 61.5ක් වැයකර මිලදීගත් කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයකට නොගැලපෙන හෙයින්, කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත පවරා දී තිබූ නමුත්, මෙම පැවරීම ගිණුම්ගත කර නොතිබුණු අතර විශ්වවිද්‍යාලය භාවිතා නොකරන වත්කමක් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත්ව තිබුණි.

(ආ) වෛද්‍ය පීඨය සඳහා මෙත්සෙවන ඉඩමෙන් අක්කර 05 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1998 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක් ගෙවා අක්කර 1 පර්චස් 34.2 ක් පවරාගෙන තිබුණි. අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු මන්දගාමීව සිදුවන අතර, දැනට පවරාගෙන ඇති ඉඩම් කොටස තක්සේරු කර ගිණුම්ගත නොකර ගෙවූ මුළු මුදල තවදුරටත් නොපියවූ අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

**2.2.3** **පැහැදිලි නොකළ වෙනස්කම්**

අත්තිකාරම් ගිණුම් විෂයයන් දෙකක ශේෂ, ඊට අදාළ උපලේඛන සමඟ සැසඳීමේදී එකතුව රු.849,455ක වෙනස්කම් නිරීක්ෂණය විය.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

Rehabilitation of Teaching and Laboratory Equipment අත්තිකාරම් තුල වර්ෂ ගණනාවක සිට පැවත එන රු.90,249ක ශේෂ සනාථ කර ගැනීම සඳහා එම අත්තිකාරම් ලබාදුන් පුද්ගලයින් හෝ ආයතන සම්බන්ධ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

2.3 **ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල ඇති සේවා සපයන බාහිර ආයතන 18ක් වෙතින් විදුලි ගාස්තු හා ජල ගාස්තු ලෙස 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයවියයුතු මුදල පිළිවෙලින් රු.2,909,024ක් හා රු.114,998ක් වූ අතර, එම මුදල් අයකර ගැනීමට විගණිත දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ අත්තිකාරම් ගිණුම් දෙකක වර්ෂ 5 ඉක්මවූ එකතුව රු.1,994,373ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ තුළ මහරගම නගර සභාවේ සභාපති වෙත 1999 පෙබරවාරි 17 දින ගෙවන ලද රු.1,310,000ක මූලධන අත්තිකාරම් මුදලක්ද ඇතුළත්ව පැවතුණි.

(ඇ) මහපොළ ශිෂ්‍යත්ව අරමුදලින් ශිෂ්‍යත්ව ලබාදී ඉතිරි මුදල් මහපොළ අරමුදල වෙත ප්‍රේෂණය කළයුතු වුවත්, එසේ කටයුතු නොකිරීම නිසා වර්ෂ ගණනාවක සිට එකතුව රු.21,197,750ක ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුල ගෙවිය යුතු ගිණුම් ලෙස දක්වා තිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 387 | ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම අවුරා තිබියදී විශ්වවිද්‍යාලය විසින් පවත්වා ගෙනයන ප්‍රධාන ජංගම ගිණුමට අදාළ මුදල් ගිණුමේ දෛනිකව රු. මිලියන 20 සිට 80 අතර වූ අයිරා ශේෂයක් වර්ෂය පුරා පවත්වාගෙන ගොස් තිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ 26 පරිච්ඡේදයේ 2.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන වන දිනයේදී ආයතනයට අයත් සියලුම භාණ්ඩ සහ ස්ථාවර වත්කම්, ඒ කාර්යය සඳහා පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් හරි වැරදි බැලිය යුතු වුවත් 2005 වර්ෂයෙන් පසුව විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. 2011 වර්ෂයේදී පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදුකර ඇතත්, එය නිවැරදිව අවසන් කොට වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ)1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාල, ප්‍රතිපාදන කොමිෂම අනුමත කර ඇති වැටුප් හා දීමනා වලට පරිබාහිරව විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන බාහිර ව්‍යාපෘති පාඨමාලා ආදායමින් රු.9,546,462ක මුදලක් දීමනා ලෙස අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත ලබාදී තිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 2/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පර්යේෂණ යෝජනාවක් පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම කමිටුව තීරණය කරන දිනක සිට |

ක්‍රියාත්මක වන පරිදි පර්යේෂණ දීමනාව ගෙවිය හැකිය. එහෙත්, විස්තරාත්මක පර්යේෂණ යෝජනාවකින් තොරව පර්යේෂණ දීමනා හිමිකම් ඇති සියලුම නිලධාරීන්ට 2014 වර්ෂය තුල එකතුව රු.92,985,311ක පර්යේෂණ දීමනා ලබා දී තිබුණු අතර, පර්යේෂණ දීමනා ලබාගත් කිසිදු නිලධාරියෙකු හෝ ආචාර්යවරයෙකු චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් වර්ෂය ආරම්භක දිනට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පනතේ සඳහන් විශ්වවිද්‍යාල අරමුදලට අමතරව වෙනත් අරමුදල් 18ක් පවත්වාගෙන ගොස් තිබූ අතර, 2014 වර්ෂය තුලදීද අනුමැතියකින් තොරව නැවත නව අරමුදල් 5ක් ආරම්භ කොට පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල පනතේ 99 (ඇ) වගන්තිය පරිදි උසස් අධ්‍යාපන ආයතනයකට කවර ප්‍රභවයකින් වුවද අත්පත් කරගත් සියලු මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළයුතු බව දක්වා ඇතත්, ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.55,609,758ක් වූ බාහිර උපාධි පාඨමාලා ආදායම වෙනත් අරමුදල් 22 කට බැර කර තිබුණි.

(ඇ) (i) විශ්වවිද්‍යාලයේ අරමුණුවලින් බැහැරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව 2014 සැප්තැම්බර් 09 දින දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ වෙනුවෙන් වත්කම් මිලදී ගැනීම සඳහා රු.1,157,455ක්ද, ගුරුවරියන්ගේ සහායකයින්ගේ වැටුප් වෙනුවෙන් රු.562,500ක් ද පෙර පාසැල් පොත්පත් සඳහා රු.463,752ක්ද වෙනත් රු.5,865ක් ද ලෙස එකතුව රු.2,189,572ක් රාජ්‍ය අරමුදල් මගින් වැයකර තිබුණි.

(ii) උපකුලපති අරමුදලේ නියෝගවලට අනුකූල නොවන සේ දිවා සුරකුම් මධ්‍යස්ථානය ආරම්භයේදී ඇතුළත් වූ ළමුන් 28 දෙනෙකු වෙනුවෙන් මහජන බැංකුවේ ගිණුම් ආරම්භ කිරීම සඳහා, උපකුලපති අරමුදලින් රු.58,000ක් වැය කර තිබුණි.

(ඈ) මුදල් අමාත්‍යාංශයේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 294ක ආයෝජනයක් සිදුකර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එලෙස ආයෝජනය කර ඇති මුළු වටිනාකම රු.මිලියන 709 ක් විය.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.145,069,392ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.341,172ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.145,410,564ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. බාහිර

ව්‍යාපෘතිවලින් ලද ආදායම්වල වැඩිවීම මූලා ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයීය පීඨ 4 හි අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයින් 11,079 දෙනෙකු වෙනුවෙන් පුනරාවර්තන වියදම් ලෙස රු 2,092,976,415ක් වැය කර තිබුණු අතර, ඊට අනුරූපීව පසුගිය වර්ෂයේ ශිෂ්‍යයින් 10,455 දෙනෙකු වෙනුවෙන් රු.1,813,208,326ක් වැයකර තිබුණි. පීඨ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වෙන අතර සාමාන්‍ය ඒක ශිෂ්‍ය පිරිවැය පසුගිය වසරට වඩා රු.15,484කින් හෙවත් සියයට 8.93 කින් වැඩිවී තිබුණි.

| **පීඨය** | **ඒක ශිෂ්‍ය පිරිවැය** | |
|---|---|---|
| | **2014** (රු) | **2013** (රු) |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 231,416 | 218,901 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 170,288 | 156,310 |
| කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය | 137,587 | 123,438 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 382,780 | 355,329 |
| සාමාන්‍යය ඒක ශිෂ්‍ය පිරිවැය | **188,913** | **173,429** |

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත මුදාහැර තිබුණු කථිකාචාර්යවරියක වෙනුවෙන් වර්ෂ කිහිපයක සිට ගෙවන ලද වැටුප් තුල ඇතුළත් රු.1,437,882ක අධ්‍යයන දීමනා අදාළ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කළ නොහැකි බව දන්වා තිබුණු බැවින්, එම මුදල් අදාළ කථිකාචාර්යවරියගෙන් අය කළයුතු වුවත්, ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පශ්චාත්/ආචාර්ය උපාධි ලබා ගැනීම සඳහා විදේශගතවූ ආචාර්යවරුන් 62 දෙනෙකු ගිවිසුම් ප්‍රකාරව නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.96,977,398ක බැඳුම්කර වටිනාකමක් අයවිය යුතුව පැවතුණි. මින් ආචාර්යවරුන් 36 දෙනෙකු විසින් ගිවිසුම් කඩකර වසර 5 සිට වසර 25ක කාලයක් ගතවී ඇතත්, එම ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු රු.38,393,477 ක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය විදේශ සම්මන්ත්‍රණ, වැඩමුළු හා කෙටිකාලීන පුහුණු පාඨමාලාවලට සහභාගි කරවීමට සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධව පොදු වැඩ පිළිවෙලක්

නොමැතිවීම හා නිලධාරීන් විසින් පෞද්ගලිකවම මෙම පාඨමාලා ලබාගැනීමට මැදිහත්වීම හේතුවෙන් පෞද්ගලික පදනමකින් මෙම තෝරා ගැනීම සිදු නොවන්නේද යන්න විගණනයේදී බැහැර කළ නොහැකිය. සමාලෝචිත වර්ෂයේ මේ සඳහා අයවැයගත ඇස්තමේන්තුව රු.මිලියන 6.5ක් වූ නමුත්, සත්‍ය වියදම රු.මිලියන 28.48ක් විය. ඉකුත් වර්ෂයේ මේ සඳහා වැය කළ මුදල රු. මිලියන 7.8ක් වූයෙන් සියයට 363ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි.

(ඈ) විශ්වවිද්‍යාල පනතේ සංශෝධිත 72 වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 150 ප්‍රකාරව වසර 8 ක් තුල පශ්චාත් හෝ ආචාර්ය උපාධියක් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සේවය අවසන් කර තිබූ ආධුනික කථිකාචාර්යවරුන් 4 දෙනෙකු පසුව ඉදිරිපත් කර තිබූ පශ්චාත් උපාධි සහතික පදනම් කර ගනිමින් ආධුනික කථිකාචාර්ය තනතුරේ තහවුරු කර තිබුණු අතර, එම කථිකාචාර්යවරුන් වෙත විශ්වවිද්‍යාල පනතේ නියමයන්ට අනුකූල නොවනසේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය ලබාදීම තුලින් නීත්‍යානුකූලව හිමි නොවන වසර 8 කට අධික සේවා කාලයක් හිමිවී තිබූ අතර, හිමිකම් නොලබන සප්ත වාර්ෂික නිවාඩු, පාරිතෝෂික දීමනා තීරු බදු රහිත වාහන බලපත්‍ර ලබා ගැනීමට අවස්ථාව ලබාදී තිබුණි. විගණිත දිනය වනවිට මින් කථිකාචාර්යවරු දෙදෙනෙකුට සහනදායි මෝටර් රථ බලපත්‍ර ලබාදී තිබුණු අතර, එක් කථිකාචාර්යවරියකට වසරක සප්ත වාර්ෂික නිවාඩු ලබා දී තිබුණි.

(ඉ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 10 දිනැති අංක HEM/2010 දරන ලිපිය මගින් අනුමැතියකින් තොරව අනියම් හා තාවකාලික පදනම මත නිලධාරීන් බඳවා නොගන්නා ලෙස හා 2011 ඔක්තෝබර් 31 දිනැති ලිපිය මගින් කළමනාකරණ හා මූල්‍ය පීඨයේ තාවකාලික තනතුර පවත්වාගෙන යාමට අවසර ලබා දීම ප්‍රතික්ෂේප කරමින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපකුලපතිවරයා වෙත ලිපි නිකුත් කර තිබියදී 2014 ජුනි 30 දිනට නිලධාරීන් 13 දෙනෙකු අනුමැතියකින් තොරව තාවකාලික හා අනියම් පදනම මත බඳවා ගනිමින් මාසිකව උපරිමය රු.25,000 වන පරිදි වැටුප් ගෙවා තිබුණි.

(ඊ) 1997 නොවැම්බර් 21 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 අනුව කථිකාචාර්ය II ශ්‍රේණියේ වසර හයක සේවා කාලයෙන් පසුව අදාළ ආචාර්යවරයා ස්වයං ඇගැයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසුව සනාතන සභාව විසින් පත් කරනු ලබන ඇගැයීම් කමිටුවට ලක්කර ස්වයං ඇගැයීම් වාර්තාව ලබාදුන් දිනට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණියට උසස් කළහැකි වුවත්, ඊට පටහැනිව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ වසර හයක් සම්පූර්ණ වූ දිනය උසස්වීම් ක්‍රියාත්මක වන දිනය ලෙස සලකා උසස්වීම ලබාදීම හේතුවෙන් ආචාර්යවරුන් පස්දෙනෙකු වෙත වසර 2 සිට වසර 11 දක්වා පසු දාතමින් උසස්වීම් ලබාදී තිබුණු අතර, නීත්‍යානුකූලව හිමි නොවන වැටුප් වර්ධකයන් ලබා දීම හේතුවෙන් රු.473,567ක හිඟ වැටුප් ගෙවා තිබුණි.

(උ) ගණකාධිකරණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා විදේශගත වීමේදී එළඹි ගිවිසුමට අනුව 2011 ඔක්තෝබර් 27 දින නැවත සේවයට වාර්තා කළයුතු වුවත්, එසේ වාර්තා නොකිරීම හේතුවෙන් 2013 මැයි 09 දින පාලක සභාව විසින් සේවය අතහැර ගියාසේ සලකා කටයුතු කර තිබුණි. උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව නැවත සේවයට වාර්තා කිරීම සඳහා මාස 03 ක් තුල අභියාචනයක් ඉල්ලුම් කළයුතු වුවත්, 2014 ජනවාරි 28 දින එනම් මාස 25කට පසු කළ ඉල්ලීමකට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 976 හා ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ඉක්මවා සේවයට නොපැමිණි කාලය වැටුප් රහිත නිවාඩු ලෙස සලකා එම කථිකාචාර්යවරයා අවසානයට ලැබූ වැටුප් පියවරෙහි පිහිටුවා බඳවා ගැනීමට පාලක සභාව තීරණය කර තිබුණි. ගිවිසුම් කඩකිරීම නිසා අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.4,036,446ක මුදලක් අයකරගෙන නොතිබූ අතර, නීත්‍යානුකූලව ලබාගත හැකි වැටුප් ඉක්මවා රු.484,165ක මුදලක් හා 2014 වර්ෂය තුල නීත්‍යානුකූලව හිමි නොවන තීරුබදු රහිත වාහන බලපත්‍රයක් ද ලබා දී තිබුණි.

(ඌ) විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයේ පරිගණක යෙදුම් සහකාර II තනතුරේ කටයුතු කළ නිලධාරියෙකු පීඨයේ ලියාපදිංචි ශිෂ්‍යයින් කිහිප දෙනෙකුගෙන් ලියාපදිංචි ගාස්තු හා විභාග ගාස්තු වංචා කිරීම් ගණනාවක් වාර්තා වී තිබියදී සහ මානව හා ශාස්ත්‍ර පීඨයේ ජනසන්නිවේදන ඩිප්ලෝමාව හැදෑරීමේදී වෙනත් උපාධි අපේක්ෂිකාවක ඉදිරිපත් කර ඇති නිබන්ධනයන් ඉදිරිපත් කරමින් විභාග වංචාවක් සිදුකර තිබියදී ඉහත චෝදනා සම්බන්ධයෙන් වැඩ තහනම් කර විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස 428 වැනි පාලක සභාව මගින් නියෝගයක් ලබාදී තිබියදී කිසිදු පරීක්ෂණයකින් තොරව එම නිලධාරියා ස්ථාන මාරුවක් සඳහා නිර්දේශ කර තිබුණි.

(එ) විශ්වවිද්‍යාලය සඳහා නවක සිසුන් බඳවා ගැනීමේදී ලබාදුන් කෙටි ආහාර වේල සඳහා ගෙන්වූ කිරිපැකට් පෙට්ටි 4ක් අස්ථානගත වී තිබීම සම්බන්ධයෙන් සිදුකළ මූලික පරීක්ෂණ වාර්තාව තුල කථිකාචාර්යවරයෙකු වංචා සහගතව කටයුතු කර ඇති බවත්, ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් කළයුතු බවත්, සඳහන් කරමින් චෝදනා පත්‍රයක් කෙටුම්පත් කර ඉදිරිපත් කර තිබූ නමුත් මෙතෙක් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඒ) පශ්චාත් උපාධි පීඨයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් හය දෙනෙකු රු.220,750ක පාඨමාලා ගාස්තු ගෙවා නොතිබියදී අවසන් විභාගවලට පෙනී සිටීමට හා උපාධිය සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබාදී තිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුල පර්යේෂණාධාර තුලින් පර්යේෂණයන් ආරම්භ කළ ආචාර්යවරුන් 18 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. මෙම පර්යේෂණ වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් රු.5,209,759ක මුදලක් පර්යේෂණාධාර ලෙස ගෙවීම් කර තිබුණි. කළමනාකරණය විසින් උක්ත පර්යේෂණ වාර්තා ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හෝ එක් එක් ආචාර්යවරයා ලබාගෙන ඇති මුදල් ආපසු අයකර ගැනීමට විගණිත දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 2/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 6(1) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලින් පර්යේෂණ වියදම් නොදැරිය යුතු බව දක්වා ඇතත් පර්යේෂණ වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන වලින් රු.මිලියන 5ක් වෙන්කර තිබුණි. පර්යේෂණ දීමනා ලබා ගැනීම සඳහා පෞද්ගලිකව පර්යේෂණයක් සිදු කළයුතු බව ඉහත චක්‍රලේඛයෙහි දක්වා ඇතත්, පර්යේෂණාධාර ලබාදී සිදුකරන පර්යේෂණයන්හි තොරතුරු ලබාදීමෙන් ආචාර්යවරුන් 21 දෙනෙකු පර්යේෂණ දීමනා ලබා ගෙන තිබුණි.

### 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියක් අවසන් වූ පසු ව්‍යාපෘති ගිණුම් වල ශුද්ධ අතිරික්තය විශ්වවිද්‍යාල අරමුදල වෙත මාරු කළයුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ අවසන්වූ ව්‍යාපෘති 8 ක ශුද්ධ අතිරික්තය වූ රු.2,015,253ක් ව්‍යාපෘතිය භාරව කටයුතු කළ නිලධාරීන් නියෝජනය කරන සංවර්ධන අරමුදල් වෙත මාරු කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවයට බඳවාගෙන ඇති කථිකාචාර්යවරුන් 9 දෙනෙකු සතියේ වැඩකරන දිනයන්හිදී රාජකාරී වේලාව තුල විශ්වවිද්‍යාල අභ්‍යන්තර ශිෂ්‍යයින් සඳහා පවත්වනු ලැබූ දේශන වෙනුවෙන් රු.359,500ක බාහිර කථිකාචාර්ය දීමනා ලබාගෙන

තිබුණි. රාජකාරී වේලාවන් තුල දේශන පැවැත්වීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් වැටුප් හා දීමනා ලබා දෙන බැවින්, ඊට අතිරේකව බාහිර කථිකාචාර්ය දීමනාවක් ගෙවීමට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොවුණි.

(ඇ) 2014 මාර්තු මාසයේදී පැවැත්වූ ශාස්ත්‍රවේදී බාහිර උපාධි II පරීක්ෂණයේ සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම විෂයයේ පිළිතුරු පැකැට්ටුවක් පරීක්ෂා කිරීම සඳහා ආචාර්යවරයෙකු වෙත තෙවරක් ගෙවීම් කර තිබුණි. පිළිතුරුපත් 200ක් අඩංගුව තිබූ එම පැකැට්ටුව තෙවැනි වර පරීක්ෂාවේදී 202 ක් පරීක්ෂා කළ බව සඳහන් කරමින් අදාළ ආචාර්යවරයා විසින් රු.24,240ක මුදලක් ඇගයීම් ගාස්තු වශයෙන් ලබාගෙන තිබුණි. පිළිතුරු පත් පරීක්ෂාව දෙවරක් සිදුවන නමුත්, තෙවරක් පරීක්ෂාවට හේතු වූ කරුණු හා පිළිතුරුපත් පැකට්ටුව තුළ අඩංගු පිළිතුරු පත් සංඛ්‍යාව ඉක්මවා ගෙවීම් සිදුකළ ආකාරයත් විගණනයේදී පැහැදිලි නොවුණි.

(ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයන් නඩත්තු කළයුතු බැවින්,විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර ගැනීමට පෞද්ගලික සමාගමක් වෙත 2005 වර්ෂයේදී රු.1,147,412ක් ගෙවා තිබුණද එවැනි ලේඛනයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පිළියෙල කර නොතිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

එකතුව රු.21,311,104ක් වූ ත්‍යාග අරමුදල් (Endowment Funds) 71 කින් රු.18,101,513ක් පමණක් ආයෝජනය කර තිබූ අතර, ඉතිරිය වූ රු. 3,209,591ක මුදල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සිසුන් 300 කට නේවාසිකාගාර පහසුකම් සපයා දීමේ අරමුණින් 1998 මැයි 05 දින බස්නාහිර පළාත් සභාවට රු.මිලියන 1.6ක් ගෙවා බොරලැස්ගමුවේ පිහිටි පර්චස් 41.31ක ඉඩමක් ලබාගෙන තිබුණි. 2003 අගෝස්තු 06 දින කැස්බෑව ප්‍රාදේශීය ලේකම්තුමා විසින් විශ්වවිද්‍යාලය වෙත එහි බුක්තිය පවරා තිබුණද එදින සිට එම ඉඩම ඵලදායි කාර්යයක් සඳහා යොදාගෙන නොතිබූ අතර, කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණි.

## 4.7 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ නීති අංශය විසින් විශ්වවිද්‍යාලයට මූල්‍ය අවාසි ඇති වන ආකාරයේ කොන්දේසි ඇතුලත් කර කුලී ගිවිසුම් සකස් කර අත්සන් කිරීම හේතුවෙන් කුලී පදනම මත ලබාගත් නේවාසිකාගාරයක ගිවිසුම අවසන් වීමට ආසන්නව තිබියදී විශ්වවිද්‍යාලය විසින් ගිවිසුමේ දින දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් සිදුකර තිබුණද ගිවිසුම්ගත පාර්ශවය ඊට එකඟතාවය ලබා නොදී පැරණි ගිවිසුමේ 23 වැනි වගන්තිය ප්‍රකාරව භාවිතා කරන කාලය වෙනුවෙන් කුලී මුදල මෙන් දෙගුණයක් ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් ගිවිසුම්ගත කාලය ඉකුත්වීමෙන් පසු භාවිතා කළ මාස 4ක කාලය වෙනුවෙන් කුලී ලෙස රු. 3,281,840ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2004 දෙසැම්බර් 23 දිනැති අංක 2004/ED/HE/63 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනි රේටයන් පදනම් කරගෙන නේවාසිකාගාරයක් සඳහා කුළී ගෙවීම් කිරීම හේතුවෙන් ගිණුම් වර්ෂය අවසාන වන විට රු.12,819,505ක් අදාළ ආයතනය වෙත වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ) 2004 වර්ෂයේදී අවසන් වූ Limnology ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ලද CDMA දුරකථනය අක්‍රිය කරවා ගැනීමට හෝ දුරකථනයක් අවශ්‍ය වෙනත් අංශයක් වෙත ලබාදීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම වර්ෂයේ සිට මාස 119ක් වෙනුවෙන් මාසික ස්ථාවර ගාස්තු රු.113,050ක් දුරකථන සමාගම වෙත ගෙවා තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ අපජලය බැහැරකිරීමේ රු.මිලියන 70ක ව්‍යාපෘතිය සඳහා 2003 අගෝස්තු 06 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර, එම ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය වෙත මූලික සැලසුම් සකස් කිරීම සඳහා රු.2,336,090ක් ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට විශ්වවිද්‍යාලය තීරණය කර තිබූ නමුත්, දැරූ වියදම මූල්‍ය ප්‍රකාශන තුල නොනිමි වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩල තනතුරු 48ක නිලධාරීන් 267 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණු අතර, පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් තනතුරු 15ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් 88ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගැනීමකින් තොරව ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිට බඳවාගෙන තිබුණි.

(ඇ) 2014 මාර්තු 31 දිනැති අංක 3/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව තනතුරු අලුතින් ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද අනුමත නොකළ තනතුරු 04 ක් සඳහා නිලධාරීන් 05 දෙනෙකු බඳවාගෙන තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 නොවිසඳී ඇති විගණන ඡේද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ 20 වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය ප්‍රකාරව අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද මෙතෙක් එවැන්නක් සකස් කර නොතිබූ බැවින්, අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවන ලද රු.1,087,509,732ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකිවිය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් කළමනාකරණය
(ආ) ගිණුම්කරණය
(ඇ) පර්යේෂණාධාර පිළිබඳ අභ්‍යන්තර පාලනය
(ඈ) ස්වයං මූල්‍ය පාඨමාලා කළමනාකරණය
(ඉ) ගබඩා පාලනය
(ඊ) ගිවිසුම් හා බැඳුම්කර අයකිරීම
(උ) ප්‍රසම්පාදනය
(ඌ) බාහිර විභාග ප්‍රශ්න පත්‍ර ඇගයීම පිළිබඳ අභ්‍යන්තර පාලනය